# 11



## කථික සංගමය



උත්පලා වීරසිංහ පාසලේ දක්ෂතම ශිෂ්‍යාවකි. පස්වැන්නේ ශිෂ්‍යත්වය සමත් වී පැමිණි ඈ ඉගෙනීමටත් බාහිර කටයුතුවලටත් එක සේ දස්කම් දක්වයි. ඈ කනිෂ්ඨ විවාද කණ්ඩායමේ නායිකාවයි. කථික සංගමය රැස් වන බොහෝ දිනවල කතාවෙන්, හා ගායනයෙන් සභාව පිනවන උත්පලා ක්‍රීඩාවට ද විශේෂ දක්ෂතා දක්වන්නී ය. මේ ඇය කථික සංගමයේ පසු ගිය සභාවාරයේ දී පැවැත්වූ කතාව ය.

සියලු දෙනාගෙන් ම අවසරයි.

අද මා කතා කිරීමට බලාපොරොත්තු වන්නේ 'කථික සංගමය' යන මාතෘකාව යටතේයි.

අප පාසලේ සමිති සමාගම් කිහිපයක් ම තියෙනවා. කථික සංගමය ඒ අතරින් ප්‍රධාන එකක්.

සංගමය පටන්ගෙන දැනට අවුරුදු අටක් පමණ වෙනවා. මම එහි සාමාජිකාවක්. අවුරුදු කීපයක් ම මම අපේ සංගමයේ රැස්වීම්වලට සහභාගි වුණා. කවි, සිංදු ගායනා කළා. කථික තරගවලට ඉදිරිපත් වුණා. එයින් මා ලැබූ ප්‍රයෝජන බොහොමයි. මගේ බය, සබකෝලය නැති වුණා. කථිකත්වය දියුණු වුණා. තර්ක කිරීමේ හැකියාව වර්ධනය වුණා වගේ ම ජය පරාජය බාර ගැනීමටත් ශක්තිය ලැබුණා. දැන් මට ඕනෑ ම සභාවක් ඉදිරියේ එඩිතර ව කතා කරන්න පුළුවන්.

සබකෝලයක් නැතිව කතා කිරීමේ හැකියාව ලැබීම කථික සංගමයකින් ඇති වන හොඳ දෙයක්. එයින් සභාවක කතා කිරීමේ හැකියාව වගේ ම කථිකත්වයත් දියුණු වෙනවා. ඒ විතරක් නෙමෙයි, කතාවකට

සුදනම් වෙන්න නම් පොතපත කියවන්න ඕනෑ. ගුවන්විදුලියට සවන් දෙන්න ඕනෑ. රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන් නරඹන්න ඕනෑ. වැදගත් දේවල් සටහන් කරගන්න ඕනෑ. බොහෝ දේවල් දන්නා කෙනකු වෙන්නේ එතකොටයි. ඒ වගේ කෙනකුට තමයි "ඇසූ පිරූ තැන් ඇත්තෙක්" කියලා කියන්නේ. එහෙම කෙනකුට සමාජයේ හොඳ පිළිගැනීමක් තියෙනවා. අපේ අධ්‍යාපන කටයුතුවලට පවා ඒක ලොකු අනුබලයක්.



අපි තව පැත්තක් ගැන හිතමු. රැස්වීම්වල කතා කිරීම නිසා තර්ක කිරීමේ ශක්තිය දියුණු වෙනවා. තම අදහස පැහැදිලි ව අනෙක් අයට ඉදිරිපත් කරන්න පුළුවන් වෙනවා. තර්කානුකූල ව සිතීමත්, පැහැදිලි ව අදහස් ඉදිරිපත් කිරීමත් නිසා සමාජයේ සැලකිල්ලක් ලැබෙනවා. බොහෝ අවස්ථාවල පාසලේ විවාද කණ්ඩායමට තෝරා ගන්නේ ඒ වගේ අයයි. කථික හා විවාද තරගවලින් ජය ගන්නේ ඒ අයයි. පාසල් අතර පැවැත්වෙන කථික තරගවලින් ජය ලබා ගෙන තම පාසලට කීර්තිය ලබා දෙන්නත් එවැනි අයයි.

මෙතැන දී අපි එක් දෙයක් මතක තියා ගන්න ඕනෑ. ඒ තමයි කථික තරගයක දී හැමදෙනාට ම ජය ගන්න බැරි බව. අනෙක් අතට එක් කෙනකුට විතරක් හැම දා ම ජය ගන්නත් බැහැ. වැරදෙන අවස්ථා තියෙනවා. පරාජය වන අවස්ථා තියෙනවා. පරාජය බාරගැනීමට තරම් හිතේ ශක්තිය දියුණු කර ගන්නත් අප අධිෂ්ඨාන කර ගත යුතුයි.

ආදරණීය සහෝදර සහෝදරියනි, කථික සංගමයේ වටිනාකම මම දැන් විස්තර කළා. අප හැම කෙනකු ම කථික සංගමයේ සාමාජිකත්වය ලබා ගත යුතුයි. කතාවට, ගායනයට, විවාදවලට ඉදිරිපත් වී අපේ හැකියාවන් දියුණු කර ගැනීමට අපි හැමදෙනා ම අධිෂ්ඨාන කර ගනිමු. මාගේ එක ම පැතුම ද එයයි.

අසා සිටි හැමදෙනාට ම ස්තුතියි.



## ක්‍රියාකාරකම 01

මෙම පාඩමෙන් කියැවෙන උත්පලාගේ හැකියාවන් මොනවා ද?
இப்பாடத்தில் குறிப்பிடப்படுகின்ற உத்பலாவின் ஆற்றல்கள் எவை?

## ක්‍රියාකාරකම 02

පාඩම කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.
பாடத்தை வாசித்து கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை தருக.

i. කථික සංගමයේ සාමාජිකයකු වීමෙන් ඇති ප්‍රයෝජන මොනවා ද?

ii. කථිකත්වය දියුණු කර ගැනීම සඳහා කළ යුතු දේවල් කියන්න.

iii. හැම දෙයක් පිළිබඳ ව ම කරුණු දන්නා කෙනකු වන්නේ කොහොම ද?

iv. කවීකයකු ලෙස ප්‍රසිද්ධ වූ විට ඔබට ලබා ගත හැකි දේවල් මොනවා ද?

## ක්‍රියාකාරකම 03

පහත දැක්වෙන කරුණු විකාශනය කරමින් ඔබ මීටර් 100 ධාවන තරගය ජයගත් ආකාරය ඔබේ මිතුරු මිතුරියන්ට පැහැදිලි කරන්න.
நீங்கள் 100 மீற்றர் ஓட்டப்போட்டியை வெற்றி கொண்டது பற்றி கீழே குறிப்பிடப்பட்டுள்ள விடயங்களும் உள்ளடங்கக்கூடிய விதமாக உங்கள் தோழர் தோழிகளுக்கு விளக்குக.

i. පළමු වන තරගයට සහභාගි වීම හා ඉන් පරාජය වීම

ii. දෙවන වර නැවතත් තරගයට සහභාගි වීම

iii. එහි දී හතර වන තැන ලැබීම

iv. හොඳ පුහුණුවක් ලැබීමට සිතා ගැනීම

v. දිනපතා පිට්ටනියට ගොස් පුහුණු වීම

vi. යහළුවන් සමග තරගයට දිවීමේ දී දෙවන තැනට පත් වීම

vii. කෙසේ හෝ පළමුවැනියා වීමට සිතා ගැනීම

viii. නිවාසාන්තර තරගයේ දී පළමුවැන්නා ලෙස තේරීම

## ක්‍රියාකාරකම 04

"ගෙදර ළමා පුස්තකාලයක් තිබීමේ යහපත" යන මාතෘකාව යටතේ කතාවක් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කරන්න. (පහත කරුණු අදාළ කරගන්න.)
''வீட்டில் சிறுவர் நூல் நிலையம் ஒன்று இருப்பதன் நன்மைகள்'' எனும் தலைப்பில் பேச்சொன்றை தயாரித்து வகுப்பில் முன்வைக்குக. (பின்வரும் விடயங்களை உள்ளடக்கிக் கொள்க)

i. කියවීම මිනිසා සම්පූර්ණ කරයි.

ii. නොයෙක් පුස්තකාල වර්ග තිබේ.

iii. තෑගි ලැබුණු පොත්, මිල දී ගත් පොත්, හා වැඩිහිටියන් කියවූ පොත් ගෙදර පුස්තකාලයේ තිබිය හැකි ය.

iv. පුවත්පත්වල ඉතා වැදගත් කරුණු ඇත. එනම්, ලිපි, චිත්‍ර, කාටූන් ආදිය ය. ඒවා කපා, පොතක් සාදා, ගෙදර පුස්තකාලයේ තබා ගත හැකි ය.

v. මෙබඳු පුස්තකාලයක් ළමයාගේ අධ්‍යාපනික ක්‍රියාකාරකම් සඳහා ප්‍රයෝජනවත් වේ.

vi. පුස්තකාලයක ඇති සියලු ම පොත්පත් පිළිවෙළට තැබිය යුතු ය.

vii. මෙබඳු පුස්තකාලයක් පරිහරණය කරන ළමයා තුළ ඉගෙනීමට උනන්දුවක් ද, ක්‍රමවත් සැලැස්මක් ඇති ව වැඩ කිරීමට පුරුද්දක් ද ඇති වේ.